# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-01-19 |

පැමිණිලිකරු : කේ.එම් සෝමරත්න බණ්ඩා මයා,
අංක 37, ඕවිස්ස දකුණ,
පූජාපිටිය.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති,
මහ/මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.

02. විදුහල්පතිනි,
මහ/උසස් බාලිකා විද්‍යාලය,
මහනුවර.

පැමිණිලි අංකය : **HRC/K/120/15**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2015 වර්ෂයේ පළමු වසර සඳහා තම දියණිය වන කේ.එම් ඉලාක්ෂි රන්දිනී දියණිය වගඋත්තරකාර විද්‍යාලයන්ට ඇතුළත් කර ගැනීමේ අරමුණින් අධ්‍යයන කාර්ය මණ්ඩල පදනම යටතේ අයදුම්පත් යොමු කරන ලද බවයි. ඒ අනුව සම්මුඛ පරීක්ෂණයන්ට ඉදිරිපත් වී මහ/මහාමායා බාලිකා විද්‍යාලය සඳහා ලකුණු 79ක්ද, මහ/උසස් බාලිකා විද්‍යාලයෙන් ලකුණු 69ක්ද ලබාගත් නමුත් තමාගේ නම තාවකාලික ලැයිස්තුවේ සඳහන් කර නොතිබූ බවත්, එහෙත් තමාට වඩා අඩු ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ නම් තාවකාලික ලැයිස්තුවට ඇතුළත්ව තිබූ බවත් දක්වා ඇත.

පසුව පාසල් දෙක සඳහාම අභියාචනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මහාමායා විද්‍යාලයේ ලකුණු ප්‍රමාණය වන ලකුණු 79 වෙනස් කොට ලකුණු 69 ක් දක්වා අඩු කර පොරොත්තු ලේඛනයට ඇතුළත් කොට ඇති බවත්,

මහ/උසස් බාලිකා විද්‍යාලය වෙතද අභියාචනා ඉදිරිපත් කළමුත් ඉන් පලක් නොවූ බවත්, තමා සමඟ අයදුම් කළ අනෙක් අයදුම්කරුවන්ට ලකුණු ලබා දීමේදී චක්‍රලේඛනයේ විධිවිධාන අනුව කටයුතු කර නොමැති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 2694924
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 2689064
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ අනුව තම දියණිය මහ/මහාමායා බාලිකා විද්‍යාලයට හෝ මහ/උසස් බාලිකා විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙනලෙසට මෙම පැමිණිල්ල මඟින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පළවන වගඋත්තරකරු

පළමු පාර්ශවීය වගඋත්තරකාර මහ/මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු අදාළ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 79 ක් ලබා ගත් නමුත් ශ්‍රී ලංගම දුර සහතිකය අනුව ඔහුගේ පදිංචි ස්ථානයේ සිට පාසලට දුර කි.මී 75 ක් වූ බැවින් ලකුණු 25 ක් පමණක් ලබා දීමට තීරණය කළ බවයි. ඒ අනුව පැමිණිලිකරු වෙත ලබා දී තිබූ ලකුණු 79 ක ප්‍රමාණයෙන් ලකුණු 10 ක් අඩු කර එම ලකුණු ප්‍රමාණය ලකුණු 69 ක් ලෙසට පරිවර්තනය කරන ලද බවද දක්වා ඇත. එසේම පැමිණිලිකරුගේ බලවත් ඉල්ලීම මත අභියාචනා පරීක්ෂණයේදී ලකුණු 10 ක් එක් කළද, පසුව නැවත ලකුණු 69 ක් ලෙස පොරොත්තු ලේඛනයේ දෙවන ස්ථානයේ ස්ථානගත කරන ලද බවද දක්වා ඇත.

එසේම පැමිණිලිකරු විසින් විරෝධතා දක්වා ඇති ඊඩී 17 යන අයද හැටන් දුෂ්කර කලාපයේ පාසලක සේවය කරන අතර, ශ්‍රී ලංගම දුර සහතිකයට අනුව එම අයගේ දුර කි.මී 115 ක් වීම මත එම අයටද ලකුණු 25 ක් ප්‍රදානය කර ඇති බවද දක්වා ඇත.

දෙවන වගඋත්තරකරු

දෙවන වගඋත්තරකාර පාර්ශවීය මහ/උසස් බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් වාර්තාවක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, අධ්‍යයන කාර්ය මණ්ඩල ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී පහත සඳහන් ලෙස ලකුණු ලබා ඇති බවයි.

| | | |
|---|---|---|
| සේවා කාලය | - | 09 |
| පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට දුර | - | 25 |
| දුෂ්කර සේවය | - | 25 |
| ලබා නොගත් නිවාඩු (වර්ෂ 5) | - | 10 |
| **මුළු ලකුණු** | - | **69** |

පැමිණිලිකරු විසින් මෙම ලකුණු පිළිබඳව සෑහීමකට පත් නොවී නැවත අභියාචනා මණ්ඩලය වෙත විරෝධතා ඉදිරිපත් කරමින් අභියාචනා ඉදිරිපත් කළද ඔහුගේ ලකුණු වල වෙනසක් සිදු නොවූ බවත්, ඉහත ගණය යටතේ තෝරාගත් අවම ලකුණු 69 ක් වන අතර, පුරප්පාඩු සඳහා පොරොත්තු ලේඛනය

අනුව ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරාගත් බවත්, පැමිණිලිකරුටද ලකුණු 69 ක් හිමි වුවද ඔහුගේ දුර ප්‍රමාණය අනුව ඔහු පොරොත්තු ලේඛනයේ දෙවන ස්ථානයේ සිටින බවත් දක්වා ඇත.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයන්හිදී අනාවරණය වී ඇති කරුණු සහ නිරීක්ෂණ:-**

පැමිණිලිකරුගේ දරුවා 2015 පළමු වසරට ඇතුළත් කර ගැනීම සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩල ගණය යටතේ මහනුවර මහාමායා හා මහනුවර උසස් බාලිකා විද්‍යාල සඳහා අයදුම්පත් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් වීමෙන් පසු මුල් අවස්ථාවේදී මහාමායා විද්‍යාලයෙන් ලකුණු 79 ක් ලබා ඇති අතර, මහනුවර උසස් බාලිකා විද්‍යාලයෙන් ලකුණු 69 ක් ලබා දී ඇත.

පැමිණිලිකරුගේ පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර පරීක්ෂා කිරීමෙන් පසු මහනුවර මහාමායා විද්‍යාලය විසින් ලබාදි තිබූ ලකුණු 79 න් ලකුණු 10 ක් අඩුකර ලකුණු 69 ක් පමණක් ලබා දී ඇති බවද නිරීක්ෂණය වේ.

චක්‍රලේඛන ප්‍රකාරව අධ්‍යයන කාර්ය මණ්ඩල ගණය යටතේ අයදුම්කරුවන්ට ලකුණු ලබා දීමේදී අයදුම්කරු පදිංචි ස්ථානයේ සිට සේවය කරන පාසලට ඇති දුර හා සේවය කරනු ලබන පාසල දුෂ්කර හෝ අතිදුෂ්කර පාසලක්ද යන්න සලකා බැලීමේදී උපයෝගී කරගන්නා නිර්ණායක ඉතා දුර්වල බව පැහැදිලිව පෙනී යයි.

දුර සලකා බැලීම සඳහා යොදාගත යුත්තේ කුමන ක්‍රමවේදයද යන්න චක්‍රලේඛනයෙහි සඳහන් නොවන බැවින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල අභිමතය පරිදි එය සිදුකරනු ලබයි. මෙම පැමිණිල්ලේදී යොදාගෙන ඇත්තේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය මඟින් දෙනු ලබන දුර සහතිකය වන අතර, එම සහතික වල සඳහන් දුර ප්‍රමාණයේ සත්‍යතාවය පිළිබඳව ගැටළු සහගත තත්වයක් පෙන්නුම් කරනු ලබයි. පැමිණිලිකරු සම්බන්ධයෙන් සලකා බැලීමේදී පැමිණිලිකරු පදිංචි පූජාපිටිය සිට සේවය කරනු ලබන නාවුල් කබරව කණිෂ්ඨ විද්‍යාලයට ලබා දී ඇති දුර ප්‍රමාණය කි.මී 103 ක් ලෙස සඳහන් වේ. එහෙත් අදාළ දුර සහතික කර ගැනීම සඳහා මහ/මහාමායා විද්‍යාලය විසින් කැඳවා ඇති වාර්තාවේ අදාළ දුර ප්‍රමාණය කි.මී 73 ක් ලෙස සඳහන් වේ. ඒ අනුව පැමිණිලිකරුට ලකුණු 10 ක් අහිමි කර ඇත. එබැවින් එහි සත්‍යය දුර ප්‍රමාණය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නිකුත් කර ඇති දුර සඳහන් පොතින් උපුටා ගන්නා ලද දත්ත ඉදිරිපත් කර ඇති අතර, එමඟින් දක්වා ඇති දුර ප්‍රමාණයන් හා තෝරාගෙන ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් ලබා දී ඇති දුර ප්‍රමාණයන් පිළිබඳව වූ

සහතිකවල සඳහන් දුර ප්‍රමාණයන් අතර පරස්පරතාවයක් පැහැදිලිව දක්නට ලැබෙන බවද නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරු සිය පැමිණිල්ල මඟින් පෙන්වා දී ඇති පරිදි තේරී පත්වී ඇති අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංගම මඟින් ලබා දී ඇති දුර සහතික මඟින් සැබෑ දුර ප්‍රමාණයට වඩා වැඩි දුර ප්‍රමාණයක් ලබා දීම මඟින් එම අයදුම්කරුවන් හට පැමිණිලිකරුට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලැබීම හේතුවෙන් පැමිණිලිකරුට පැහැදිලි ලෙස අගතියක් සිදුව ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු පෙන්වා දෙන 02 වන මූලික කරුණ වන්නේ, දුෂ්කර කලාපයක සේවය කිරීම වෙනුවෙන් ලබාදෙන ලකුණු ප්‍රමාණය ලබාදීමේදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් දුෂ්කර පාසල් නොවන පාසල් සඳහා දුෂ්කර පාසල් ලෙස සලකා ලකුණු ලබා දීම මඟින් අසාධාරණයක් සිදුවූ බවයි. චක්‍රලේඛයේ පැහැදිලි ලෙස දුෂ්කර පාසලක සේවය සඳහා ලකුණු ලබා දිය යුතු බව සඳහන්ව තිබෙන නමුත් සමහර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දුෂ්කර කලාපයක සේවය කරනු ලබන බව පවසා අයදුම්කරුවන් වෙත ලකුණු ලබා දී ඇති බවත්, දුෂ්කර කලාපයක සියළු පාසල් දුෂ්කර නොවන අතර දුෂ්කර නොවන පාසල් සඳහා දුෂ්කර ලෙස සලකා ලකුණු ලබාදීම මඟින් තේරී පත්වී ඇති අයදුම්කරුවන්ට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා දී ඇති බවත්, එමඟින් පැමිණිලිකරු තේරීම් ලේඛනයේ පහළට පැමිණීම හේතුවෙන් පැමිණිලිකරුට අගතියක් සිදුවී ඇති බවත් තහවුරු වේ.

මෙම පැමිණිල්ලෙහි පැමිණිලිකරු විරෝධතා ඉදිරිපත් කර ඇති,

මප/ප/ නුගගොල්ල මහ විද්‍යාලය,

මප/හැ/ ලිඳුල මහ විද්‍යාලය,

මප/ව/ සිදුහත් මහ විද්‍යාලය

යන විද්‍යාල සඳහා තේරී පත්වී ඇති අයදුම්කරුවන් හට දුෂ්කර පාසලක සේවය වෙනුවෙන් ලකුණු ලබා දී ඇති නමුත්, විමර්ශන කටයුතු සඳහා පළාත් අධ්‍යක්ෂ වෙතින් කැඳවන ලද වාර්තාවෙහි අදාළ පැසැල් දුෂ්කර හෝ අති දුෂ්කර පාසල් නොවන බව සහතික කර ඇත. ඒ අනුව අදාළ අයදුම්කරුවන් හට එම පාසල් සඳහා ලබාදෙනු ලැබූ දුෂ්කර පාසලක සේවය කිරීම වෙනුවෙන් ලබාදිය යුතු ලකුණු 25 ලබා නොදිය යුතු බව නිරීක්ෂණය වේ. ඒ අනුව තේරීම්ලාභීන් වෙත වැඩිදුර ලකුණු 25 බැගින් ලැබීම හේතුවෙන් පැමිණිලිකරුට අගතියක් සිදුවී ඇති බව නිගමනය කළ හැක.

තවද පැමිණිලිකරු විසින් අදාළ පාසල් 2 හිම අභියාචනා මණ්ඩලය වෙත දුර ප්‍රමාණයක් සඳහා ලකුණු ලබා දීම හා දුෂ්කර පාසල් සඳහා ලකුණු ලබා දී ඇති ආකාරය පිළිබඳ විරෝධතා ඉදිරිපත් කළද ඒ පිළිබඳව සලකා බලා නොමැති බවද තහවුරු වී ඇත.

**නිගමනය :-**

පැමිණිලිකරු තම දරුවා 2015 වර්ෂයේ පළමු වසරට මහ/මහාමායා හා මහ/උසස් බාලිකා විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල ගණය යටතේ ඉල්ලුම් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමේදී සම්මුඛ පරීක්ෂණයේදී දුෂ්කර පාසලක සේවය කිරීම වෙනුවෙන් ලකුණු ලබා දීම හා පදිංචි ස්ථානයේ සිට සේවය කරනු ලබන පාසලට ඇති දුර ප්‍රමාණය සඳහා ලකුණු ලබා දීමේදී පැමිණිලිකරු සමඟ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ඇති අයදුම්කරුවන් කිහිප දෙනකු වෙත අදාළ නිර්ණායකයන් සඳහා අවිධිමත් ආකාරයට ලකුණු ලබා දීමෙන් පැමිණිලිකරුට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් අනෙකුත් අයවලුන් වෙත ලැබීම මත පැමිණිලිකරුට අගතියක් සිදුව ඇති බව කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

**නිර්දේශය :-**

මේ අනුව පැමිණිලිකරුගේ දියණිය මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට (2015) ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

2016.02.1 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

HUMAN RIGHTS COMMISSION
OF SRI LANKA
CHAIRMAN
COMMISSIONERS

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය, මහනුවර. B/